**බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ**
**රියදුරු තනතුර සඳහා වන බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම.(විවෘත)**

" බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින III ශ්‍රේණියේ රියදුරු **තනතුරු 04 ක්** සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **තනතුරට අදාළ කාර්යයන්** - ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන ප්‍රවාහන කාර්යයන් ඉටු කිරීම

02. **බඳවාගැනීමේ සුදුසුකම්**

- **අධ්‍යාපන සුදුසුකම් :**
  i. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක්(02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.(එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත් ව තිබිය යුතුය.)

- **වෘත්තීය සුදුසුකම් :**
  i. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන්වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.
  (බඳවා ගන්නා දිනට වසර තුනක(03) ට පෙර අවම වශයෙන් "සී" සහ"සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

  ii. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

  ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන්ගෙන් පිරවීමට ඇති අවස්ථාවලදී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, "ඒ1" සහ "සී1" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී සහ ඩී1 පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ ඒ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඩී පන්තියේ බලපත්‍රයක්)

03. **පළපුරුද්ද** :
  i. බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක(03) පළපුරුද්දක් තිබිය යුතුය.(පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

04. **කායික සුදුසුකම්**
  i. අවම උස අඩි පහක් (5) විය යුතුය.
  ii දිවා කාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.

05. **වෙනත් සුදුසුකම්**
  i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
  ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.( දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
  iii. අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
  iv. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

සැලකිය යුතුයි- තනතුරට බඳවා ගැනීම සඳහා අදාල සියලු සුදුසුකම් 2026.09.14 දින හෝ ඊට පෙර සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ.

CamScanner

06. වැටුප් පරිමාණය 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයෙහි PL 03-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාල වැටුප් පරිමාණය-

රු.42,780-10x490 -10x540 -10x590 -12x630 - රු. 66,540
( උප ලේඛන III අනුව වැටුප් ගෙවනු ලබන බව)

07. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

වෘත්තිය පරික්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරික්ෂණයක් මගිනි.

වෘත්තිය පරික්ෂණය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| 2.මාර්ග නීති පිළිබද ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 3.මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබද මූලික දැනුම | 20 | 10 |

වෘත්තිය පරික්ෂණය පවත්වන බලධරයා

ඉහත වෘත්තිය පරික්ෂණය පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන පහත සදහන් නිලධාරියන්ගෙන් සමන්විත පරික්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්වේ.

1.පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන විධායක/මාණ්ඩලික නිලධාරියෙකු
2.මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරික්ෂකයෙකු
3.පොලිස් රථ වාහන අංශයේ නිලධරයකු

සාමාන්‍ය සම්මුඛ පරික්ෂණය

බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරික්ෂා කිරීම සදහා පැවැත්වේ.ලකුණු ලබා දීමක් සිදු නොකරයි.

09. සේවා කොන්දේසි :

9.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයද , බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද අනුව කටයුතු කල යුතුය.

10. භාෂා ප්‍රවීණතාවය :

| භාෂාව | ශ්‍රේණිය | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|---|
| 1. රාජ්‍ය භාෂාව | III | සේවය බැදී ඇත්තේ රාජ්‍ය භාෂාවකින් නොවේ නම් පරිවාස කාලය තුළ රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතු ය |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | III | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය |

11. සම්මුඛ පරික්ෂණ අවස්ථාවේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සදහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කල වලංගු ජාතික හැඳුනුම්පත,වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය සම්මුඛ පරික්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

CamScanner

12. **අයදුම්පත් එවිය යුතු පිළිවෙල**

- අයදුම්කරුවන් තම අයදුම්පත මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින්, තමා විසින්ම නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කල අයදුම්පත්‍රය 2026.09.14 දිනට පෙර පහත ලිපිනයට ලැබෙන සේ **ලියාපදිංචි** තැපෑලෙන් එවිය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ තනතුරක් දරන අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය)

  ලේකම්,<br>
  සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා,<br>
  කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත<br>
  8 වන මහළ, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල,<br>
  අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
  බත්තරමුල්ල.

- නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් නියමිත දිනට හෝ එදිනට පෙර නොලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. අයදුම්පත්‍රය https://healthmin.wp.gov.lk ඔස්සේද බාගත කල හැකිය.

14. **මෙම තනතුරට බඳවා ගැනීමට අදාල සුදුසුකම් හෝ වෙනත් කුමන කරුණක් සම්බන්ධයෙන් ගැටළුවක් ඇති වුවහොත් ඒ පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් සතු වේ.**

එල්.ඒ. කළුකපුආරච්චි,<br>
ලේකම්,<br>
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන,<br>
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ<br>
සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත<br>
2026.08.10

එල්. ඒ. කළුකපුආරච්චි.<br>
ලේකම්<br>
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සුභ සාධන.<br>
වාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ<br>
සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ
රියදුරු තනතුරට බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය

1. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම : ..........
   (ii) සම්පූර්ණ නම : ..........

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3. පෞද්ගලික විස්තර
   i. ස්ථිර ලිපිනය : ..........
   ii. ග්‍රාම නිලධාරී කොට්ඨාශය හා අංකය : ..........
   iii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..........
   iv. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........
   v. ඉහත ලිපිනයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද : ..........
   *(පදිංචිය ග්‍රාම නිලධාරී සහතිකයක් මඟින් සනාථ කළ යුතු ය)*
   vi. දුරකථන අංක : ..........
   vii. උපන් දිනය : ..........
   viii. 2026.09.14 දිනට වයස : අවුරුදු .......... මාස .......... දින
   ix. උස : අඩි ..........

4. අධ්‍යාපන සුදුසුකම් (සනාථ කර ගැනීම සඳහා අධ්‍යාපන සහතික වල පිටපතක් එවිය යුතුයි.)

---------------- අ.පො.ස. (සා.පෙළ)----------------

විභාග අංකය (පළමුවර) : ..........

| විෂයය | සාමාර්ථය (වර්ෂය) | | විෂයය | සාමාර්ථය (වර්ෂය) |
|---|---|---|---|---|
| • .......... | .......... (..........) | | • .......... | .......... (..........) |
| • .......... | .......... (..........) | | • .......... | .......... (..........) |
| • .......... | .......... (..........) | | • .......... | .......... (..........) |
| • .......... | .......... (..........) | | • .......... | .......... (..........) |

---------------- අ.පො.ස. (සා.පෙළ)----------------

විභාග අංකය (දෙවන වර) : ..........

| විෂයය | සාමාර්ථය (වර්ෂය) | | විෂයය | සාමාර්ථය (වර්ෂය) |
|---|---|---|---|---|
| • .......... | .......... (..........) | | • .......... | .......... (..........) |
| • .......... | .......... (..........) | | • .......... | .......... (..........) |
| • .......... | .......... (..........) | | • .......... | .......... (..........) |
| • .......... | .......... (..........) | | • .......... | .......... (..........) |

5. වලංගු රියදුරු බලපත්‍ර වර්ගය ..........

*( සනාථ කර ගැනීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයේ පිටපතක් එවිය යුතුය.)*

CamScanner

5.1 කල් ඉකුත් වන දිනය .........................................

6. පළපුරුද්ද .........................................................................................................

( විධිමත් සහතිකයක් මගින් සනාථ කල යුතුය.)

7. ශාරීරික යෝග්‍ය තාවය ........................................................................................................

(විධිමත් වෛද්‍ය සහතිකයක් මගින් සනාථ කල යුතුය)

8. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියෙන් දඬුවම් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

9. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට / සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය / සම්මුඛ පරීක්ෂණයට කැඳවීම අවලංගු කල හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

දිනය : ..............................

..............................................

අයදුම්කරුගේ අත්සන

---

<u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................ මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව / රාජකාරී වශයෙන් හඳුනන බවත්, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති සියළු තොරතුරු නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

අත්සන :

(නිල මුද්‍රාව)

නම :

තනතුර :

දිනය :

CamScanner